# ශ්‍රී ලංකා පාසලක අන්තකර්රණ අධ්‍යාපනය ක්‍රියාත්මක වන ආකාරය



**පළමු ශ්‍රේණියට නැවත ඇතුළත් වුණ නෙත්මිගේ කතාව**

සෑම අවුරුද්දකම ලංකාවේ පාසල්වල පළමු ශ්‍රේණියට සිසුන් බඳවාගනු ලබන්නේ උත්සවාකාරයෙනි. කොළඹ නගර පරිවාරයේ පිහිටි මේ පාසලේ පළමු ශ්‍රේණියට සිසුන් බඳවාගැනීමේ උත්සවයේදී දෙවෙනි ශ්‍රේණියේ සිසුන් අතින් මල් පොකුරක් පිළිගෙන නෙත්මි ද පළමු ශ්‍රේණියට ඇතුළත් වුණාය. නැවත ඇතුළත් වුණාය කීවත් වරදක් නැත. ඒ ඇයි? මීට කලින් වසර කීපයක්ම ඇය ඉගෙනගත්තේ එම පාසලේම විශේෂ අධ්‍යාපන ඒකකයේයි. ඇය ඩවුන්ස් සහලක්ෂණය සහිත ගැහැණු ළමයෙකි.

"නෙත්මිගේ ප්‍රායෝගික කුසලතා සංවධර්නය කර, පළමු ශ්‍රේණියේ විෂය නිදෙර්ශය යම් දුරකට කළ හැකි මට්ටමට දියුණු වුණාට පසුව අපි ඇය පළමු ශ්‍රේණියට ඇතුළත් කළා," යි අපට පැවසුවේ විශේෂ අධ්‍යාපන ඒකකය භාර ගුරුතුමියයි. "ඊට කලින් අපි පළමු ශ්‍රේණියේ ගුරුතුමිය හොඳින් දැනුවත් කළා. නෙත්මිට අනෙක් සිසුන් සමග එකට ජීවත් වෙමින් ඉගෙනීමට අවස්ථාව ලබාදීමයි අපේ අරමුණ," යි ඇය තවදුරටත් ප්‍රකාශ කලා.

"ඇතුළත් කිරීමේ කටයුතු සාමාන්‍ය පරිදි සිදුකළ නිසා අනෙක් ළමයින්ටවත්, මව්පියන්ටවත් නෙත්මිගේ කිසිදු වෙනසක් පෙනුණේ නැහැ. හැමෝම ඇය ආදරයෙන් භාරගත්තා.," යි නෙත්මිගේ පන්ති භාර ගුරුතුමිය පැවසුවාය. "හෙමින් වුණත්, ඇය අනෙක් සිසුන් එක්ක වැඩ කරගෙන යනවා. ඇතැම් ක්‍රියාකාරකම් ඇයට තරමක් අමාරුයි. මං ඇය වෙනුවෙන් විශේෂයෙන් ඉගෙනුම් ආධාරක සැලසුම් කරගෙන එනවා."

සියලු ළමයින්ට පාසල් යාමට, ඉගෙනීමට සහ දියුණු වීමට අවශ්‍ය කුසලතා වධර්නය කරගැනීමට සාධාරණ අවස්ථා ලබාදීමේ ඵලදායී ක්‍රමය වන්නේ අන්තකර්රණ අධ්‍යාපනයයි. අන්තකර්රණ අධ්‍යාපනය යනු සියලුම ළමයින් බොහෝ විට එකම පාසලේ, එකම පන්තිකාමරවල හෝ ළමයාට කිසි සේත්ම චලනය විය නොහැකි නම් නිවසේදී හෝ ඉගෙන ගැනීම හා සම්බන්ධ සංකල්පීය රාමුවකි. දරුවාට සංඥා භාෂාව වැනි කිසියම් විශේෂිත භාෂාවක් හරහා ඉගෙන ගැනීමට අවශ්‍ය නම්, විශේෂිත පාසලකදී එයට ද අවස්ථාව ලබාදීම එමගින් තහවුරු කරනු ලැබේ.

නෙත්මිට මෙම පාසලෙන් සාධාරණ අධ්‍යාපන අවස්ථා තහවුරු කර දී තිබේ. නෙත්මිට පමණක් නොව, තවත් බොහෝ දරුවන්ටත් එම අවස්ථාව ලැබේ.

මීළඟ වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා අයදුම් කර තිබියදී හඳුනාගන්නා ලද විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති පිරිමි ළමයකු කල් තබාම විශේෂ අධ්‍යාපන ඒකකයට කැඳවාගෙන තිබුණු අයුරු අපි නිරීක්ෂණය කළෙමු. එසේ කළේ එම ශිෂ්‍යයාගේ හැකියාවන් වධර්නය කර අන්තකර්රණයට සූදානම් කිරීම සඳහා බව ගුරුතුමිය අප සමග පැවසුවාය.

**සසිඳු හා සමාධි; විශේෂ අවධානය අවශ්‍ය ළමුන් දෙදෙනෙක්**

පස්වන ශ්‍රේණියේ සෙසු ළමයින් සමග ඉගෙනුම ලබන සසිඳු ඌන අවධානය සහිත අධික්‍රියාකාරී තත්වයේ (Attention Deficiency Hyperactive Disorder child - ADHD) ළමයෙකි. ඔහුගේ චයර්‍යාවන්ගේ වෙනස්කම් ඇත. ඒ පිළිබඳ විශේෂ අධ්‍යාපන ගුරුවරිය සෙසු ගුරුවරුන් දැනුවත් කර තිබේ.

"මේ තමයි මගේ යාළුවා," යි සසිඳු ඔහුගේ අසල්වැසි මිතුරිය වන සයුමි පෙන්වමින් කීවේය. "එයා මට නිතරම උදව් කරනවා."

"මම සයුමිට පවරලා තියෙනවා සසිඳුට උදව් කරන්නට," යි 5 ශ්‍රේණිය භාර ගුරුවරිය පැවසුවාය. "සසිඳුගේ අවධානය ඇතැම්විට ගිලිහෙනවා. ඔහු වැනි ළමයින් හඳුනාගෙන සහකම්පනයෙන් යුතුව කටයුතු කරන්නට පාසලෙන් අපව දැනුවත් කර තිබෙනවා."

"සසිඳු මාත් එක්ක එකතුවෙලා වැඩ කරනවා. එයා හොඳයි," යි සයුමි පැවසුවාය.

තුන්වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සමාධි ද බුද්ධිමය දුබලතා සහිත ගැහැණු ළමයෙකි.

"සමාධි දිගටම හිටියේ අනෙක් සිසුන් එක්කමයි. ඇය තනි නොකර, සමූහයත් එක්ක එකට ඉදිරියට ගෙන යන්නට තමයි අපට උපදෙස් දීලා තියෙන්නෙ. ඇය යහළුවන් ඇසුරට හුඟක් කැමතියි," යනුවෙන් ඇගේ පන්ති භාර ගුරුතුමිය පැවසුවාය. "ඇයට ටික වෙලාවක් ඉගෙනගන්නකොට පාඩම් වැඩවලට කම්මැලි හිතෙනවා. ඒ වෙලාවට එයාට පන්තියෙන් එළියට යන්නට ඕනැ වෙනවා. වැසිකිළි යන්නට, වතුර බොන්නට යන්නට අවසර ඉල්ලනවා. අධ්‍යාපනයෙදි සමාධි වෙනුවෙන් විශේෂ අවධානයක් අවශ්‍යයි."

මෙම පාසල අන්තකර්රණ අධ්‍යාපනයට හැඩගස්වන ලද පාසලකි. එහි ගුරුවරුන්ටත්, සිසුන්ටත් සියලු සිසුන් එකට ඉගෙනීමේ අවශ්‍යතාව ගැන අවබෝධයක් ඇත. එම අවබෝධය නිමර්‍ාණය කරන්නට පාසලේ විදුහල්පතිවරයා, නියෝජ්‍ය විදුහල්පතිවරු, අංශ භාර ගුරුවරු සහ සෙසු සියලු ගුරුවරු දායක වෙති.

**ගගනගේ රෝද පුටුවට පඩි නැති පාරක්**



පාසලක අන්තකර්රණ අධ්‍යාපන ගුණය ගොඩනගන්නට හා වඩර්නය කරන්නට අවශ්‍ය වන්නේ සහකම්පනයයි. විශේෂ අවශ්‍යතා ඇති ළමයින් හඳුනාගැනීමෙන් හා ඔවුන්ට විශේෂ අවධානනක් යොමු කිරීමෙන් අධ්‍යාපනයේ සාධාරණ අවස්ථා ඔවුන් වෙනුවෙන් නිමර්‍ාණය කළ හැකිය.

ගගන ඉගෙන ගන්නේ අටවන ශ්‍රේණියේයි. ඔහු රෝද පුටුවකින් ගමන් කිරීම සිදුකරන පිරිමි ළමයෙකි. ඔහුගේ රෝද පුටුවට ගැලපෙන ඩෙස්ක් එකක් ඔහුට පාසලෙන් සපයා තිබේ. එය සෙසු ඩෙස්ක්වලට වඩා තරමින් ලොකුය. රෝද පුටුවේ සිට පන්තියේ කටයුතුවලට සහභාගී වීමට ඔහුට එමගින් අවස්ථාව ලැබේ. “රෝද පුටුව පන්තියේ තියලා ත්‍රීවීල් එකෙන් තමයි ගෙදර යන්නෙ. නිවසේදී පාවිච්චි කරන්නට වෙනම රෝද පුටුවක් තිබෙනවා,” යි සසිඳු පැවසීය.

“පන්තියේදී යහළුවන් ඔහුට ගොඩක් උදව් කරනවා,” යි ගගනගේ පන්තියේ එම අවස්ථාවේ උගන්වමින් සිටි ගුරුවරිය අපට කීවාය. “අපේ පාසලේ මේ දරුවන්ට හැම අවස්ථාවක්ම ලබාදෙනවා. ගගන වාෂරීක අධ්‍යාපන චාරිකාවට පවා සහභාගී වුණා. ඔහුට ඔහුගේ පියා එක්ක එයට සහභාගී වන්නට අවස්ථාව ලබාදුන්නා.”

ගගනගේ හොඳම මිතුරා චතුරයි. “අපි පෙර පාසලේ පටන්ම යහළුවෝ. මම ගගනව රෝද පුටුවෙන් පුස්තකාලෙට, අයිටී කාමරේට එක්කගෙන යනවා. ඔහුට උදව් කිරීම මට සතුටක්.”

මෙම පාසලේ ගොඩනැගිලිවල ද මුලදී දුබලතා සහිත පුද්ගලයන් සඳහා ප්‍රවේශ පහසුකම් සපයා තිබුණේ නැත. එහෙත්, පාසල ගගන වෙනුවෙන්ම සියුම් වැඩි දියුණු කරමින් සංචලන දුබලතා සහිත සිසුවකුට රෝද පුටුවකින් ගමන් කළ හැකි ආකාරයට ප්‍රවේශ පහසුකම් සකස් කර තිබේ.

“අපට ඒ වෙනුවෙන් ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවුණ නිසා පාසල් සංවධර්න සමිතියේ උපකාර ද ලබාගත්තා,” යි විදුහල්පතිතුමා පැවසීය. දැන් ගගනට වැසිකිළියට පමණක් නොව, මිදුලට, පුස්තකාලයට සහ තොරතුරු තාක්ෂණ කාමරයට ද රෝද පුටුවෙන් යාමට හැකිය.

“මේ පාසලේ කොමෝඩ් වැසිකිළියක් තියෙනවා. ඒක මගේ පුතාට ලොකු පහසුවක්,” යි ගගනගේ මව අප සමග කීවාය. ඔහුට පිටතට යන්නට උවමනා වූ විට යහළුවෝ ගගනගේ රෝද පුටුව තල්ලු කරගෙන යති. ගගනගේ මවට ඔහු වෙනුවෙන් කාලය ගත කළ හැකි බැවින් ඔහුගේ අවශ්‍යතා සඳහා පාසල් භූමියේ රැඳී සිටීමට ගගනගේ පවුලේ අයගෙන් උපකාර ලබා ගැනීමට පාසල විසින් තීරණය කරන ලදි.

**අන්තකර්රණ අධ්‍යාපනය**



“විශේෂ අධ්‍යාපන ඒකකයේ වගේම සාමාන්‍ය පන්ති කාමරවල ඉගෙනගන්නා කථන, සංචලන, බුද්ධිමය දුබලතා සහිත සිසුන් මේ පාසලේ ඉන්නවා.” යි පාසලේ විදුහල්පතිවරයා පැවසීය. “ඒ වගේම, විශේෂ අවශ්‍යතා ඇති සිසුන් හඳුනාගන්නටත් අපට වැඩපිළිවෙලක් තිබෙනවා. ඒ අයට අවශ්‍ය පහසුකම් පාසලෙන් සපයනවා. ඔවුන් පිළිබඳ ගුරුවරුන් දැනුවත් කර තිබෙනවා. සෙසු සිසුන් වගේම ඔවුන්ගේ මව්පියන්වත්, ඔවුන්ගේ වයසට සහ අවබෝධතා මට්ටම් අනුව ගැලපෙන පරිදි දැනුවත් කිරීම අත්‍යවශ්‍යයි.

ඔවුන් දැනුවත් වුණාම සියලු සිසුන්ට සම අවස්ථා ලබාදීම පහසු වෙනවා. දුබලතා හේතුවෙන් කිසිදු සිසුවකු කොන්කිරීමට ලක්නොවන පරිසරයක් අප නිමර්ාණය කර තිබෙනවා.''

අන්තකර්රණ අධ්‍යාපනය ගැන ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා අවධානය යොමුකර තිබීම මෙම පාසලේ විශේෂම ලක්ෂණයයි. ඒ වෙනුවෙන් ශිෂ්‍ය උපදේශනය සඳහා වෙන්කරන ලද ගුරුවරිය අන්තකර්රණ සම්බන්ධීකාරක ලෙස  පාසලෙන් පත්කර තිබේ. අධ්‍යාපනවේදී උපාධිධාරී ගුරුවරියක වන ඇය මෙසේ පැවසුවාය: ''ප්‍රාථමික, සෞන්දයර්, ක්‍රීඩා ආදී විෂයයන් උගන්වන ගුරුවරුන්, ගුරුවරියන් හැමදෙනාටම අන්තකර්රණ අධ්‍යාපනය ගැන පුහුණුව අත්‍යවශ්‍යයි. දුබලතා සහිත හා විශේෂ අධ්‍යාපන අවශ්‍යතා තිබෙන සිසුන් හඳුනාගෙන ඔවුන්ට සම අවස්ථා ලබාදීමට කටයුතු කිරීම එමගින් පහසු වෙනවා. ''

සියලු ගුරුවරුන්ගේ ගුරු පුහුණුවීම්වලදී අන්තකර්රණ අධ්‍යාපනය කෙරෙහි වැඩි අවධානයක් යොමුකළ යුතු බව විදුහල්පතිවරයා අප සමුගනිද්දී පෙන්වා දුන්නේය.

(අන්තකර්රණ අධ්‍යාපනය යනු සියලුම දරුවන්ට පාසලට පැමිණීමටත් සහ ඔවුන්ගේ දියුණු වීම සඳහා අවශ්‍ය නිපුණතා ඉගෙනීමට සහ වධර්නය කරගැනීමටත් සාධාරණ අවස්ථා ලබා දීමේ ඵලදායී ක්‍රමයකි. අන්තකර්රණ අධ්‍යාපනය ඔස්සේ විවිධ හේතූන් මත බැහැර කරන ලද කණ්ඩායම් සඳහා සැබෑ ඉගෙනුම් අවස්ථා උදා වේ. පාසල් ප්‍රජාවේ ආකල්ප වෙනස් කිරීමෙන් සහ සමහර විට සුළු යටිතල පහසුකම්වල සුළු වැඩිදියුණු කිරීම් මගින් ශ්‍රී ලංකාවේ පාසල් වඩාත් අන්තකර්රණ හිතවාදී කළ හැකිය. පාසල්වල අන්තකර්රණ අධ්‍යාපනය ප්‍රවධර්නය කිරීම සඳහා 2019 වසරේ සිට අධ්‍යාපන අමාත්‍යාංශය ජපානයේ ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) සමඟ එක්ව කටයුතු කරන අතර පාසල්වල අන්තකර්රණ අධ්‍යාපනය සිදුවන ආකාරය මෙම ලිපි මාලාවෙහිදී සමීපව නිරීක්ෂණය කරනු ලැබේ. මෙම කථා බොහෝ පාසල්වල සැබෑ ජීවිත අත්දැකීම් වන අතර ඒවා ශ්‍රී ලංකාවේ ඕනෑම පාසල් පසුබිමක ක්‍රියාත්මක කළ හැකිය.)